**ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2016**

**----------------------------------------------------**

ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 18(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නිවාස ආධාර ලබාදීම සහ වෙනත් කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.49,845,980 ක මුදලක් ලබා දී තිබූ අතර ඒවා අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදලේ රු.28,075,848 ක් වූ ආරම්භක ශේෂය රු.25,452,448 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.2,623,400 කින් සමුච්චිත අරමුදලද සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු.8,540,930 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.5,917,530 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවයද රු.2,623,400 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,540,930 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,449,936 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,990,866 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් වියදම් රු.33,569,469 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් අරමුණු 22 ක් අතුරින් පහත කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ලබාදිය හැකි සේවා සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම, ආබාධවලට ප්‍රධාන හේතු දැනගැනීම හා ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම, ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සළසා අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීම, ඔවුන් වෙනුවෙන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම යනාදී කාර්යයන් ඉටුකරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබූ කර්තව්‍යයන් 04 ක් ඉටුකිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ආබාධිත සිසුන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම**

සමාලෝචිත වර්ෂයේදී ආබාධිත සිසුන් 400 ක් සඳහා ආධාර ලබාදීමට රු.3,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ආබාධිත සිසුන් 377 දෙනෙකු සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් රු.3,132,382 ක් වැය කර තිබුණි.

(i) අධ්‍යාපන ආධාර ලබාදීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින ආබාධිත දරුවන් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර දිස්ත්‍රික්ක 25 න් මුලතිව්, නුවරඑළිය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක තුනෙහි කිසිදු ආබාධිත දරුවෙකුට අධ්‍යාපන ආධාර ලබාදී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ආබාධිත සිසුන් 377 දෙනෙකුට අධ්‍යාපන ආධාර ලබාදී තිබුණ ද ඉන් සිසුන් 332 දෙනෙකුට එම ආධාර නිසි පරිදි ආධාරලාභියා වෙත ලබාදී ඇති බැව් සනාථ කර ගැනීමට පසුවිපරම් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ආධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඇතැම් අයදුම්පත්වල පවතින අඩුපාඩු හේතුවෙන් ඒවා ප්‍රතික්ෂේපවන අතර එම අයදුම්පත් සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් සිදුකර නොතිබුණි.

**(ආ) වෛද්‍ය ආධාර ලබාදීම**

සමාලෝචිත වර්ෂයේදී ආබාධිතයින් 300 දෙනෙකු සඳහා වෛද්‍ය ආධාර ලබාදීමට රු.6,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෛද්‍ය ආධාර වශයෙන් ආබාධිත රෝගීන් 405 දෙනෙකු සඳහා රු.6,029,310 ක් වැයකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෛද්‍ය ආධාර ඉල්ලුම් කරන ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල වෛද්‍ය ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 405 ක් වුවද, ප්‍රතිලාභීන් 374 දෙනෙකුගෙන් එම ප්‍රතිලාභ ලැබුණු බවට තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**(ඇ) ආබාධිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම**

අඩු ආදායම්ලාභී නිවාස නොමැති ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහනට ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් සමාලෝචිත වර්ෂයේදී රු.33,793,090 ක් ලැබී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ආබාධිත පුද්ගලයන්ට නිවාස ඉදිකිරීමට වාරික වශයෙන් මුදල් ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් වූ මුළු නිවාස සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ii) නිවාස ආධාර ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආබාධිත තැනැත්තන්ට වාරික 534 කින් ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 165 කට රු.49,845,980 ක මුදලක් ලබාදී තිබුණි. කෙසේ වුවද, ලබාදී තිබුණු මුදලින් 2007 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදය තුල ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සඳහා වාරික 226 ක් වෙනුවෙන් රු.21,575,000 ක්ද, සමාලෝචිත වර්ෂයේ අළුතින් ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සඳහා වාරික 116 ක් වෙනුවෙන් රු.17,825,000 ක්ද වශයෙන් වාරික 342 ක් සඳහා එකතුව රු.39,400,000 ක් ලබාදී තිබුණි. ඒ අනුව රු.10,445,980 ක් නිවාස ඉදිකිරීම සඳහා බෙදාදීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුල රඳවාගෙන තිබුණු අතර ඒ පිළිබඳව පසුවිපරම් සභාව විසින් සිදු කර නොතිබුණි.

(iii) නිවාස ආධාර ලබාදීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා නිවාස ආධාර ලබාදීම ආරම්භ කර තිබූ 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 22 ක ඉදිවෙමින් පවතින නිවාස 329 ක් සඳහා තවදුරටත් රු.3,580,402 ක් ලබාදිය යුතුව පැවතුණි.

(iv) ඉකුත් වර්ෂයේ දී නිවාස ආධාර ලබාදීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදුන් මුදලින් නැවත සභාව වෙත රු.4,311,271 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු එවා තිබුණු අතර එම මුදල් නැවත නිවාස ආධාර ලෙස ලබාදීමට යොදාගෙන නොතිබුණි.

(v) ආබාධිත පුද්ගලයන් සභාව වෙතින් නිවාස ආධාර ඉල්ලුම් කර තිබුණු අතර එහිදී වාර්ෂිකව විශාල අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ලැබී ඇති බැව් නිරීක්ෂණය විය. කෙසේ වුවද ඒවා ලැබෙන පිළිවෙලට ලේඛනගත කර නොතිබුණි. සමහර නිවාස ආධාර අයදුම්පත ලැබී වර්ෂයකට වැඩි කාලයක් සභාව තුළ රැඳී තිබෙන අවස්ථා හා නිවාස ආධාර ලබාදීමේදී විශාල කාලප්‍රමාදයක් පවතින අවස්ථා ද විය.

**(ඈ) ආදායම් උත්පාදනය සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම**

ආබාධිත පුද්ගලයන් සිටින අඩු ආදායම්ලාභී පවුල්වලට ආර්ථික තත්ත්වය ශක්තිමත් කරගැනීම සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීමට හෝ වැඩිදියුණු කිරීමට පුද්ගලයන් 500 දෙනෙකුට ලබාදීමට රු.9,300,000 ක ප්‍රතිපාදන සැලසී තිබුණි. එසේවුවද ආබාධිත පුද්ගලයන් 386 දෙනෙකුට රු.9,298,904 ක් ලබාදී තිබුණි. මේ සම්බන්ධව ඍජු අධීක්ෂණයක් සිදුකර ප්‍රගති වාර්තා සභාව වෙත එවන මෙන් ප්‍රාදේශීය ලේකම්වරු වෙත සභාව විසින් ලිඛිතව දන්වා තිබුණද, ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 26 ක් වුවද දැනට සත්‍ය වශයෙන් 15 ක් පමණක් සේවයේ යොදවා ඇති බැවින් පුරප්පාඩු 11 ක් නිරීක්ෂණය විය. එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම ප්‍රමාද තත්ත්වයක පැවතිණි. එසේම පවතින කාර්ය මණ්ඩලයෙන් ක්‍රියාකාරී සැළැස්මට අනුව අපේක්ෂිත කාර්යභාරය ඉටුකර ගැනීමද අභියෝගාත්මක වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

සභාව විසින් 2016 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශය යටතේ විසර්ජන ගිණුමෙන් නිදහස් කරන ලද ප්‍රතිපාදිත අරමුදල් භාවිතා කිරීමක් පමණක් සිදුව තිබුණි. එහෙයින් කළමනාකරණ පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනයක් සකස් කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ආධාර නිසිලෙස ගිණුම්ගත නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නොපිරවීම ජාතික සභාවේ ඉලක්කගත කාර්යසාධනය සම්පූර්ණ කිරීමට අපහසුවීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | ආබාධිත පුද්ගලයන්ට නිසි පරිදි ආධාර නොලැබීම හා ඒ සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදු නොවීම. |